# මාරියා මොන්ටිසෝරිගේ ළමා සංවර්ධන අවධි

ඩබ්.කේ.ඩී. කීර්තිරත්න

## හැඳින්වීම

1931 අගොස්තු මස 31 වන දින ඉතාලියේ දී උපත ලැබූ මාරියා මොන්ටිසෝරි අධ්‍යාපනය සම්බන්ධ දාර්ශනිකයෙකි. මනෝවිද්‍යාඥවරියකි. එවැනිවම ඇය අධ්‍යාපනඥවරියකි. මාරියා මොන්ටිසෝරි, 1896 දී වෘත්තියෙන් වෛද්‍යවරියක් බවට පත්වූවාය. වෛද්‍ය උපාධිය ලැබීමෙන් පසු සංවර්ධනය අඩාල දරුවන් සමඟ වැඩ කළ ඇය එහිදී අධ්‍යාපන දර්ශනය පිළිබඳවත් ඉගැන්වීම් ක්‍රම විද්‍යාව පිළිබඳවත් හැදෑරුවාය. 1900 දී මොන්ටිසෝරි මානසික ආබාධ සහිත දරුවන් සමග වැඩ කරන ගුරුවරුන් පුහුණු කිරීමේ පාසලක අධ්‍යක්ෂකවරියක් බවට පත් වූවාය. 1907 දී ඇය “Children’s House” නමින් රෝමයේ දී පළමු පෙර පාසල ආරම්භ කළාය. මෙම කාල වකවානුවේ දී පෙර පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ දී යොදා ගත හැකි විෂයමාලා, ළමා සංවර්ධනය සම්බන්ධ ඉගැන්වීම් පෙර පාසල් අධ්‍යාපනයේ දී ඉගෙනුම සඳහා පහසුකම් සැලසීම සඳහා යොදා ගතහැකි ඉගෙනුම් උපකරණ සහ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ තොරතුරු පර්යේෂණ මට්ටමින් දියුණු කිරීමට කටයුතු කළාය. මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇය කළ කැපකිරීම් පසුකාලීනව පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් වීමට බලපෑවාය. තවද, මොන්ටිසෝරි පූර්ව ළමාවිය අධ්‍යාපනය හා දරුවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ආයතන ගණනාවක තනතුරු රැසක් දැරුවාය. 1952 මැයි මස 6 වන දින ඇය මෙලොවින් සමුගත්තාය.

## මොන්ටිසෝරිගේ සංවර්ධන අවධි පිළිබඳ හැඳින්වීම

මොන්ටිසෝරි ඉදිරිපත් කළ ආකාරයට ළමා සංවර්ධන අවධි ස්වභාවික රටාවකට දිග හැරෙයි. ළමයා පසුකරන හැම සංවර්ධිත අවස්ථාවක්ම ඊටම අදාළව ගොඩනගා ගන්නා කුසලතා කට්ටලයකින් යුක්ත වෙයි. එකිනෙකට වෙනස් අවදිවල පසුවන දරුවන්ට ඇත්තේ

එකිනෙකට වෙනස් අවශ්‍යතාවන් බව ප්‍රකාශ කරන ඇය තවදුරටත් සඳහන් කරන්නේ මෙම අදහස වෙනත් අධ්‍යාපඥයන් ද දරණ බවය. එක් එක් අවධියෙහිදී සිදුවන සංවර්ධන ක්‍රියාවලියෙහි ස්වභාවය ඊළග සංවර්ධන අවධිය කෙරෙහි ධනාත්මකව හෝ සෘණාත්මකව බලපෑම මෙහිදි දක්නට ලැබෙන සුවිශේෂි ලක්ෂණයකි (Selda, et al., 2012). මනෝවිශ්ලේෂණවාදි ගුරු කුලයේදී ද මේ අදහස පිළිගනියි. ඔවුනට අනුව කිසියම් අවශ්‍යතාවක් නිශ්චිතව සම්පූර්ණ නොවුනොත් එම පුද්ගලයා පසු යුගයක දී නැවත එම යුගයට අදාළ දේ කිරීමට පෙළඹිය හැකිය. උදාහරණයක් ලෙස කුඩාකල මවගේ ආදරය සහ සොයා බැලීම නිසි ලෙස නොලැබුණු අය වඩා වැඩි වයසින් යුතු අය හා විවාහ විය හැකිය (Montessori, 1971). එහෙයින්, මොන්ටිසෝරි පවසන්නේ ප්‍රශස්ත ළමා සංවර්ධනයක් සඳහා එක් එක් අවධියෙහි දී සම්පූර්ණ විය යුතු ලක්ෂණ හොඳින් ළමයා තුළ තහවුරු විය යුතු බවය. මොන්ටිසෝරිට අනුව දරුවකු ඒකාකාරි බවකින් හා එකම අනුපාතයකින් වර්ධනය නොවේ. එක් එක් ළමයා සම්බන්ධයෙන් සිදුවන වෙනස්කම් නොවූවත් සංවර්ධන ක්‍රියාවලිය පොදු ආකෘතියකට අනුව සිදු වේ. මොන්ටිසෝරි ළමා සංවර්ධනය සම්බන්ධයෙන් දක්වන අවධි “Plane” ලෙස ඉංග්‍රීසි ව්‍යවහාරයේදී හඳුන්වයි. මෙම එකිනෙකට වෙනස් අවධි ඔස්සේ ළමා සංවර්ධනය සිදුවීමේ දී, පෙර අවධියේ දී සිදු වූ වෙනස්කම් ද සහිතව ළමයා ඊළග සංවර්ධන අවධියට ළඟාවීම මොන්ටිසෝරි දකින්නේ යලි ඉපදීමක් ලෙසය. මොන්ටිසෝරිගේ ළමා සංවර්ධනය අවධි, මුල් ළමාවිය (0-6, The Absorbent Mind), ළමා විය (6-12, Conscious Imagination), වැඩිහිටි විය (12-18, Adolescence). සහ පරිණත විය (18-24, Maturity) ලෙස අවධි හතරක් යටතේ දක්වයි. මෙම හැම සංවර්ධන අවධියක්ම, සංවර්ධන අවධි හා ඒකාබද්ධ අවධි ලෙස නැවත කොටස් දෙකකට බෙදෙයි (එමිලි, 2023).

අඛණ්ඩව දිවෙන රේඛාවක් මත ත්‍රිකෝණ කිහිපයක් ඇසුරින් මොන්ටිසෝරි දක්වන සංවර්ධන අවධි නිරූපණය කොට දැක්විය හැකිය.




## මුල් ළමාවිය (0 - 6)

මොන්ටිසෝරි මුල් ළමාවිය (0-6) අවධි දෙකකට බෙදා දක්වයි. එවැනිවම, ඇය මෙම අවධිය ඉංග්‍රීසි භාෂාවේ දී උරාගැනීමේ මනස යන අදහසින් "Absorbent Mind" ලෙස දක්වයි. උපතේ සිට අවුරුදු තුන දක්වා (0-3) කාලය එක් අවධියක් ලෙසත්, අවුරුදු තුනේ සිට අවුරුදු හය දක්වා (3-6) කාලය තවත් අවධියක් ලෙසත් මෙම අවධිය කොටස් දෙකකට බෙදා දක්වයි. මුල් ළමාවියට අදාළ (0-3) කාලය නිවසේ ද ඉතිරි කොටස එනම් අවුරුදු 3-6 දක්වා කාලය පාසලේ ද ගෙවී යයි. මෙහි 0-3 අතර කාලයට අයත් පළමු අවධියේ දී ළමයා කායිකව හා ජීවවිද්‍යාත්මකව නිදහසේ සංවර්ධනය වන යුගයක් ලෙස සැළකේ. මෙහි මුල් අවුරුදු තුනේදී ඉන්ද්‍රිය මගින් ලෝකය ගවේෂණය කරමින් අනුත්සාහිකව සංවේදන ඇසුරින් අත්දැකීම් ලබා ගන්නා කාලයකි. මෙම යුගය අවිඥාණිකව අත්දැකීම් ලබා ගන්නා කාලයක් ලෙස ද මොන්ටිසෝරි හඳුන්වයි. ස්පොන්ජ් කැබැල්ලක් ජලය උරා ගන්නාක් මෙන් පරිසරය ආශ්‍රයෙන් තමා හා ගැටෙන අත්දැකීම් අනුත්සාහිකව උරා ගනියි. එබැවින් ළමයා හා ගැටෙන පරිසරය යහපත් විය යුතුය. ලස්සන විය යුතුය. ධනාත්මක විය යුතුය.

මුල් ළමාවියේ දී දරුවා තමාව බලාගන්නන් මත යැපෙයි. සංයුක්ත බැඳීම් මත සියල්ල ගොඩ නැගෙයි. භාෂා හැකියා සංවර්ධනය

කර ගැනීම, චාලක හැකියා වර්ධනය කර ගැනීම හා සමාජානුයෝජන ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම මෙම යුගයේ තවත් ලක්ෂණ කිහිපයකි. වැඩිහිටියන්ට ඇහුන්කන් දී භාෂාව සංවර්ධනය කර ගනියි. එහෙයින්, ළමයා ඉදිරියේ ප්‍රකාශ කරන දේ පිළිබඳ සැලකිලිමත් විය යුතුය. 0-3 අතර කාලයට අයත් යුගය සඳහා මොන්ටිසෝරි පාසල් අධ්‍යාපනයක් නිර්දේශ නොකරයි.

පෙර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ වන්නේ වයස අවුරුදු 3-6 දක්වා දිවෙන මුල් ළමාවියෙහි දෙවන අධියරේදී ය. ළමයා විසින් පිරිපහදු කරගනිමින් අත්දැකීම සංජානනය කර ගැනීම මෙම යුගයේ සුවිශේෂී ලක්ෂණයකි. එකම දේ නැවත නැවත කරයි. එමගින් සතුටක් ලබයි. අත්දැකීම් ගොඩ නගා ගැනීම සවිඥානිකව සිදු කරගනියි. නව දැනුම් ඒකක වෙන් වෙන් වූ හැකියාවන් සේ ගොඩ නගා ගනියි. වරණීය හැකියා භාවිත කරමින් නිදහසේ අවශ්‍යය ඉගෙනුම් අවස්ථා අත්පත් කර ගනියි.

මාරියා මොන්ටිසෝරි ඉදිරිපත් කරන ආකාරයට කායික මානසික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රශස්ත වීම මුල් ළමාවියෙහි දී ප්‍රකට විය යුතු ලක්ෂණයකි. මෙම යුගයේ දී ළමයාට ආදරය හා ආරක්ෂාව පිළිබඳ හැඟීම් හොඳින් දැනෙයි. එහෙයින් ආදරය හා ආරක්ෂාව සොයයි. තමා හා බැඳුණු අවට ලෝකයට අනුවර්තනය වීමට උත්සුක වෙයි. සංසන්දන හැකියා විධිමත් කර ගනියි. චාලක හැකියා සමායෝජනය කරගනිමින් ක්‍රියාකාරකම්වල යෙදෙයි. ක්‍රියාකාරි බව ළමයාගේ චාලක හැකියා පමණක් නොව බුද්ධිමය හැකියා ද ප්‍රශස්ත ලෙස සංවර්ධනය කරයි. මෙමගින් ළමයා අපේක්ෂිත බුද්ධි මට්ටමට වඩා එහාට ගොස් යමක් ඉගෙන ගනියි. හොඳින් ක්‍රියාකාරීව වැඩෙන දරුවාට තමාට වඩා වයසින් වැඩි දරුවන් වෙනුවෙන් සකස් කළ ක්‍රියාකාරකම්වල ද යෙදීමේ හැකියාව ගොඩනැගෙයි. ළමයා වඩා ක්‍රියාකාරි නිසා කායික චලන හේතුවක් නොමැතිව සිදුවෙයි. ක්‍රියාකාරකම් පාදක අත්දැකීම් ඉදිරියෙහි දී දැනුම හොඳින් ගොඩ නගා ගනියි (මොන්ටිසෝරි, 1995). හුදෙකලාව හෝ කණ්ඩායම්ගතව ඉගෙන ගැනීමට යොමුවෙයි. බුද්ධිමය නිදහස අපේක්ෂා කරයි. ස්වයං කාර්යක්ෂමතාව දියුණු කරගනියි. පරිකල්පන හැකියා මතුකර ගැනීමට යොමුවෙයි. කිසියම් අපේක්ෂාවක් හෝ අරමුණක් සහිතව ක්‍රියාකාරකම්වල නියැලෙයි. මොන්ටිසෝරිට අනුව, සාමාන්‍ය ළමයෙකු අන් අයව ආදර්ශයට

ගැනීමට පැවසූ විට ඒ පිළිබඳ මැලිකමක් හා පසුගාමී බවක් දක්වයි. නිදහසේ ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිදහස් පරිසරයක හැදෙන දරුවකු ඉතාම කරුණික මෙන්ම හොඳ ශිලාචාර බවක් පෙන්වයි (මොන්ටිසෝරි, 1995). එය හුදු හැඟීමක්ම පමණක් නොව කිසියම් මානව ගුණධර්ම මුසු වූ හිතවත් කමක් ප්‍රකාශ කරීමකි. නිරීක්ෂණය තුළින් මෙම අවධියේ ළමුන් ඉගෙන ගනියි. ඔවුන් ඇඳුම්වලට කැමැතිය. එවැනිවම ඔවුන් තමා වටා සිටින හොඳින් අඳින ලද අයවලුන් දැකීමට ද කැමතිය. ඒ පමණක් නොව ඒ අනුව තමන්ද හොඳින් පිළිවෙළකට ඇඳීමට රුචිකත්වයක් ඇති කර ගනියි. නිරීක්‍ෂණ ඇසුරින් ලබාගත් අත්දැකීම් මත දත් මැදීම, කොණ්ඩය පීරීම හා කණ්ණාඩිය ඉදිරියට ගොස් තම පෙනුම ආකර්ෂණීය ලෙස සකස් කර ගැනීමට පෙළඹවෙයි. පරිසරයේ අලංකාරවත් බවද ළමයාට බලපායි. අලංකාරවත් පරිසරය වැඩෙන දරුවා මල්වැවීම වැනි ක්‍රියාකාරකම් මගින් පරිසරය අලංකාරවත් කරගැනීමට යොමුවෙයි. ළමයා ඔහුව පෙරපාසල සම්බන්ධයෙන් කුඩා නිවසක අයිතිකරුවෙක් ලෙස දකින විට මෙම සියලු දේ ඔවුන් තුළ සංවිධානය වෙයි. එත් සමඟ දරුවා ඉතාම සංසුන් අයෙක් බවට පත්වෙයි. ආත්ම අභිමානයක්, ආත්ම ගරුත්වයක් හා නිදහස්ව ජීවිතය ගොඩ නගා ගනියි.

ළමයාට ආරක්ෂිත බව හොඳින් දැනෙන ලෙස නිවසේ පරිසරය හා පෙරපාසල් පරිසරය සකස් වීම වැදගත්ය. තමාව ආරක්‍ෂා කිරීමට අයෙක් සිටින බව ළමයාට දැනිය යුතුය. දෙමාපියන් හා ගුරුවරු ද ලස්සනට ජීවත් වීමට කැමති අය වීම වැදගත් ය. ලස්සන එමෙන්ම මනාව පිළිවෙළකට සකස් වූ නිවසක ජීවත්වීමට දෙමාපියන් තුළ පවතින කැමැත්ත ධනාත්මකව දරුවාට ද බලපායි. මෙවැනි පරිසරයක වෙසෙන දරුවා හොඳින් සංස්කෘතිකගත වූවෙක් වෙයි. එවැනිවම නිහඬ හා ක්‍රියාශීලි වෙයි. පෙර පාසලේ සාමකාමී බව හා නිහඬ බව දරුවාට ඉතා වැදගත් ය. ළමයාගේ ජීවිතයේ ඊළඟ කාලපරිච්ඡේද සාර්ථකව ගතවීමට මෙම මුල් අවධිය ඉහත සඳහන් ආකාරයට හොඳින් සංවිධානය වී තිබිය යුතු ය (Montesori, 1971). දරුවා අවට සිටින සෙසු ප්‍රජාව, සංස්කෘතික මෙන්ම ස්වාභාවික ලෝකය සම්බන්ධයෙන් සිසුවාගේ කාර්ය භාර්ය පැහැදිලි කළයුතු කාලයකි. එවැනිවම වැඩිහිටි අවදියට අදාළව ඔවුන්ගෙන් සිදුවිය යුතු යුතුකම් සහ වගකීම් තේරුම්ගත යුතු අවදියක් ද වෙයි.

වැඩිහිටියන් සම්බන්ධයෙන් ගත්විට, මෙම යුගය තුළ ළමයින් සමඟ ගනුදෙනු කිරීමේ දී ඉගැන්වීමේ ක්‍රමවිද්‍යාව පිළිබඳ දැනුමක් අවශ්‍ය නොවේ. එම අවධියට ආවේණික වූ පුළුල් අවශ්‍යතා සම්පූර්ණ වන ආකාරයට ළමයාගේ සංවර්ධනය සිදුවන වටපිටාවක් සකස් කිරීම හොඳින් සිදුවිය යුතුය. ජීව විද්‍යා දෘෂ්ටිකෝණයෙන් බලා ළමයා විධිමත් කාල පරිච්ඡේදයක් පසුකරන බව දැන සිටිය යුතුය. ළමයාගේ පෞරුෂය ඇගයීමට ලක් කළ යුතුය. එවැනිවම, ළමයාට සමාජ ජීවිතයක් මෙන්ම කිසියම් ප්‍රමාණයකට නිදහසක් ද අවැසි බව වැඩිහිටියන් දැන සිටීම වැදගත්ය.

නිදහස් පරිසරයේ දී ළමයා විසින්ම ගොඩනගාගත් ක්‍රියාකාරකම් ඇසුරින් නිදහසේ ක්‍රියාකාරී වීමට අවස්ථා සැලසිය යුතුය. මෙහි නිදහස යනුවෙන් අර්ථ දක්වන්නේ ළමයා කැමති ඕනෑම දෙයක් කිරීමට ඉඩ දීම නොවන අතර උදව්වක් නොමැතිව ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම වේ. මොන්ටිසෝරියට යන ළමයා මොන්ටිසෝරිය ඇසුරින් ලබන අත්දැකීම් නිවසේ දී දැකිය යුතුය. මොන්ටිසෝරියේ දී ලබන අත්දැකීම් සහ නිවසේ දී ලබන අත්දැකීම් අතර වෙනසක් නොවිය යුතුය. අතුගෑම, උපකරණවල දූවිලි පිසදැමීම, තමාගේ ඇඳුම තමා විසින්ම ඇඳ ගැනීම වැනි ක්‍රියාකාරකම් නිදහසේ තනිවම කර ගැනීමට ළමයාව හුරු කළ යුතු වේ. තමා හා සිටින අනෙකාට කරදරයක් වූ විට ඉක්මනින් එම අවස්ථාවේ දී උදවු කරන දරුවෙකු වීම වැදගත් ය. උදාහරණ ලෙස මොන්ටිසෝරියේ තමා හා එකට ඉගෙන ගන්නා සමපදස්ථයකුගේ අතේ ඇති පබළු පිරුණු කෝප්පය බිම වැටුණහොත් එම බිම වැටුණු පබළු නැවත අහුලාගෙන ගැටලුව විසඳා ගැනීමට උදවු කරන සමපදස්ථයන් පිරිසක් වෙසෙන මොන්ටිසෝරියක් නිර්මාණය කිරීම පෙර පාසලෙන් අපේක්ෂා කෙරේ. මෙය සානුකම්පිත බව වැඩෙන දරුවන් වෙසෙන පරිසරයක ලක්ෂණයකි.

කිසියම් ගැටලුවක් ඇති වූ විට වැඩිහිටියන් අනවශ්‍යය ලෙස එකී ගැටලුව විසඳා ගැනීමට උදවු කරන්නට ඉදිරිපත් වේ නම් එය අර්ථ රහිත ක්‍රියාවකි. ගැටලුවක දී ක්‍රියා කළයුතු ආකාරය ළමයාගේ බුද්ධිය ඔහුට කියා දෙයි. අනවශ්‍යය ලෙස උදවු කළහොත් ළමයා තමාගේ බුද්ධියෙන් නොව අනෙකුගේ බුද්ධියෙන් වැඩ කරන්නෙක්

වෙයි. මොන්ටිසෝරිට අනුව, මෙම අවධියේ දී ළමයාගේ ඉල්ලීම වනුයේ "එය මට මා විසින්ම කර ගැනීමට ඉඩ දෙන්න" යන්නයි. හැම අනවශ්‍යය උදව්වක්ම ළමයාගේ සංවර්ධනයට කරන අනවශ්‍යය බාධාවකි. මෙම යුගයේ දී ළමයි ඉබේම ක්‍රියාකාරි වෙයි.

**ළමාවිය (6 -12)**

ළමාවිය කායිකව හා මනෝවිද්‍යාත්මකව වෙනස්කම් රැසක් සිදුවන යුගයකි. මෙම යුගයේ දී මුතුවන් දත් හැලෙයි. ඒ වෙනුවට විශාල ශක්තිමත් ගැඹුරු එමෙන්ම මුල් බැසගත් දන්ත පද්ධතියකට හිමිකරුවෝ වෙති. වක් වූ හිසකෙස් සෘජු මෙන්ම කළුවර්ණයෙන් යුක්ත වෙයි. මහත සහ බෝල සිරුර දිලිසෙන කෙට්ටු සිරුරක් බවට පත්වෙයි. ශරීරයෙන් සහ මුහුණෙන් සමෝච්ඡ හැඩයක් ප්‍රදර්ශනය වෙයි. මුල් අවධියේ දී දක්නට ලැබුණු ආදරණීය චර්යාවන්, වෙනුවට කිසියම් තදගති සහිත චර්යා ලක්ෂණ මතුව එයි. මෙම ස්වභාවය වැඩිහිටි විය දක්වා දිවෙයි. එහෙයින් මෙම අවධිය "රළු අවධිය ලෙස" හඳුන්වයි. ඉංග්‍රිසි භාෂාවේදී මෙම අවධිය හඳුන්වන්නේ "Conscious Imagination" ලෙසයි.

ළමා විය සාපේක්ෂව නිහඬ සහ ස්ථාවර යුගයකි. තවද මෙම අවධියේ ළමුන් තුළ විවිධ මානසික ආකල්ප ගොඩ නැගෙයි. බුද්ධි සංවර්ධනය සඳහා විශාල විභවයක් පවතින යුගයකි. සංයුක්ත චින්තනයෙන් වියුක්ත චින්තනයට මාරු වන යුගයක් ලෙස ද මෙම යුගය සැලකේ (Marshall, 2017). වෙනත් අයුරකින් පැවසුවහොත් අවශෝෂණ මනසින් වෙන්වී තාර්කික මනසකට එළඹෙන යුගයකි. පරිකල්පන හැකියා භාවිත කරයි. මූලික වශයෙන් මෙම යුගයේ දී ඇයි? මොකක්ද? ඒක කොහොමද? යන ප්‍රශ්නවලට පිළිතුරු සොයයි. ජීවිතයෙහි විශාල සැලැස්ම තුළ ඔවුන් විසින් ලෝකයට ඉටුකළ යුතුකම් කොටස කුමක්දැයි සිතයි. මොන්ටිසෝරි මෙය "විශ්වීය සැලසුම" ලෙස හඳුන්වයි. ළමාවියේ දී විශ්වීය දැක්මක් ළමයාට ලබා දිය යුතු අතර විශ්වයේ යථාර්ථය තේරුම් ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් කළ යුතුය. එවැනිවම ප්‍රශ්නවලට පිළිතුරු සෙවිය හැකි පසුබිමක් ගොඩ නැගිය යුතුය (Montessori, 1938).

අභ්‍යන්තර හා බාහිර පිළිවෙළ අගය කරන මෙම අවධියෙහි දී වික්‍රමාන්විත බව වර්ධනය කර ගනියි. වීරාභිවන්දනයෙහි යෙදෙයි. රංචු ලැදියාව ඉහළ මට්ටමක පවතියි. සාධාරණත්වය අගය කරයි. අනන්‍යතාවය අන්තර් සබඳතා ගොඩනැගීම හා සදාචාර රාමුවක සිට සාධාරණත්වය මත පිහිටා ගැටලු විසඳීමට අපේක්ෂා කරයි. දැනුම සඳහා අසීමිත පිපාසයක් පවතියි. නිදහසේ කියවීමේ හැකියාව ඇත. ගැටලුවලට නිවැරදි පිළිතුරු ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකරයි. නිර්මාණශීලි වෙයි. බලාපොරොත්තු සහගතයි. තවද, මෙම අවධියේ දී ළමයා සාමාජශීලි වෙයි. යම් සිදුවීමකට හේතු සොයයි. විමසිලිමත් වෙයි. වෙනස්වීම් පිළිබඳව අන් අයට දැනුවත් කරයි. වෙනස්වීම්වලට හේතු සොයයි.

නිදහස විවිධ ක්ෂේත්‍රවලට අදාළව අපේක්ෂා කරයි. බලාපොරොත්තුවලට විවිධ නිෂ්ටාවන් වෙයි. තමා කරනු ලබන ක්‍රියාකාරකම් පුළුල් නොකොට, තමාගේ චින්තන පරාසයට හසුවන ප්‍රමාණයට ලබාගත හැකි නව අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍යය යුගයකි. සංයුක්ත චින්තනයෙහි ලක්ෂණ තවදුරටත් පැවතියේ ද මොවුන් දාර්ශනිකයන් නොවුනත් වියුක්ත චින්තන හැකියා වර්ධනය කරගැනීමට ආරම්භයක් ලබා ගනියි.

එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවීම්වලට හේතු සොයා බලයි. හොඳ යනු කුමක් ද? නරක යනු කුමක් ද? වැනි දේ පිළිබඳ විමසිලිමත් වෙයි. මුල් අවධියේ දී දරුවකුට යමක් "හොඳයි" හෝ "නරකයි" යයි පැවසූ විට එය එළෙස පිළිගත්ත ද මේ යුගයේ දරුවා එසේ නොවෙයි. ඇයි නරක? ඇයි හොඳ? යන ඍණ හෝ ධන ඇගයුම් පිළිබඳ විමසිලිමත් වෙයි.

නිවෙස් පරිසරයෙහි බැඳීම්වලින් වෙන් වීම මෙම යුගයේ තවත් ලක්ෂණයකි. දරුවා තම පිළිවෙළ හෝ අපිළිවෙල පිළිබඳ කණගාටුවට පත් නොවේ. නිතරම නිවසින් එළියට යාමට කැමතියි. පවුලෙන් දමන තහංචි හා ආරක්ෂාව කරදරයක් ලෙස දකියි. ජීවිතයෙන් කොටසක් පාසලෙන් හා නිවසෙන් පිට තිබිය යුතු බව සිතයි. මුල් අවධියේ දී නිවසේ තිබෙන ගෘහ භාණ්ඩ හා අලංකාරමත් බව පිළිබඳව පැවති ධනාත්මක හැඟීම් තවදුරටත් වලංගු නොවන අතර ඒවායින්

තෘප්තිමත් නොවේ. මුල් අවධියට වඩා කිසියම් දෙයක් කිරීමට ගන්නා උත්සාහයෙහි ස්වභාවය වඩාත් වෙනස් වෙයි. වඩා රළු පරිසරයක, ඉතා ගැඹුරු හා පුළුල් සමාජ සම්බන්ධතා තුළින් වෙනස් වූ අත්දැකීම් සොයයි. නිශ්චිත පරිසර, පුළුල් සමාජ සබඳතා, පුළුල් අත්දැකීම් හා පුළුල් නිදහස අපේක්ෂා කරයි. ස්වභාව ධර්මය හා මානව සමාජය සමඟ පුළුල් සබඳතා ගොඩ නගා ගැනීමට මෙම යුගයේ දී දරුවන් ගන්නා උත්සහාය මගින් ඔවුනගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා තේරුම්ගත හැකිය.

මෙම අවධියෙහි කතන්දර කීම හා රූකඩ වැනි දේ ආශ්‍රයෙන් ඉගැන්වීම සිදුකළ හැකිය. මොන්ටිසෝරි මෙම යුගයේ දී භූගෝල විද්‍යාව, ඉතිහාසය, භාෂාව හා ගණිතය වැනි විෂයන් ඉගැන්වීමට යෝජනා කරයි. මෙකී අවධියේ දී ගුරුවරයා ළමයාට ආකෘතියකි. ළමයාගෙන් අපේක්ෂා කරන දෙයම ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු බව සිතයි. ළමයා හොඳ විය යුතු යයි සිතන්නේ නම් ගුරුවරයා ද හොඳ විය යුතුය. ළමයා සදාචාර සම්පන්න විය යුතු නම් ගුරුවරයාද සාදාචාර සම්පන්න විය යුතුය (Spatia, n.d.). එවැනිවම, ළමයාගේ ම ඉඩකඩක ඉගෙනීමට ඉඩහැරීම, සංයුක්ත හා වියුක්ත අත්දැකීම් ලැබිය හැකි සේ පාඩම් සැලසුම් කිරීම, විෂයයන් අතර එකිනෙකට සබඳතාව ගොඩනැගීම, නායකත්ව අවස්ථා හා සමාජානු යෝජන අවස්ථා දියුණු කිරීම මෙන්ම බහුල කිරීම, බහු වයස් පන්ති කාමර නිර්මාණය කිරීම, එක් එක් සිසුවා අරමුණු කරගත් සුවිශේෂි ඉගෙනුම් උපකරණය භාවිතය, ළමයා තුළ ආත්ම විශ්වාසය, නිදහස සහ ආත්ම අභිමානය වැඩි කෙරෙන පන්ති කාමර වාතාවරණයක් ගොඩ නැගීම මේ යුගයේ දරුවන්ට ඉගැන්වීමේ දී සම්පූර්ණ වියයුතු බව මොන්ටිසෝරි පැහැදිලි කරයි. බාල දක්ෂ වැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් මේ යුගයට ඉතා සුදුසු ය.

දරුවාගේ සංස්කෘතික සංවර්ධනය සඳහා ගවේෂණ ඉගෙනුම සංවිධානය කිරීම පාසලක කාර්යභාරය විය යුතුය. ළමයාට ඉගෙනීමට අවශ්‍යය විද්‍යාත්මක දේ සැපයීම පමණක් නොව පංතිකාමරයෙන් පිටතට ගොස් අත්දැකීම් ලබා ගැනීමට ඉඩකඩ සකස් කළයුතුය. ඉගෙනුම් අත්දැකීම් තහවුරු කරගැනීමට අවශ්‍ය මෙවලම් පාසලෙන් අපේක්ෂා නොකරන මේ වයසේ දරුවන් තම පංතිකාමරයෙන් පිටතට

ගොස් තමා විසින්ම ඒවා සොයා ගැනීමට රුචිකත්වයක් දක්වයි. සුරතලෙකු මෙන් වැඩීමට ළමයා රුචියක් නොදක්වයි. සරල ජීවිතයක් අපේක්ෂා කරන ගමන්ම පවුලෙන් බැහැර වූ නිදහස් ජීවිතයක් අගය කරයි. තමාගේ පොත් බෑගය තමා විසින්ම ඔසවාගෙන යා හැකි බව පවසන්නේ නම් හෝ තමාට විවෘත එළිමහනේ නිදාගත හැකි බව පවසන්නේ නම් හෝ එමගින් තහවුරු වන්නේ ඔහුගේ පෞරුෂය සංක්‍රාන්තික සමයක පවතින බවයි. මෙම වෙනස්වීම පුළුල් පරිසරය තුළදී හොඳින් සිදුව ඇත්නම් ඉන් ගම්‍යවන්නේ ළමයා තම සංස්කෘතිය හොඳින් ගවේෂණය කරගෙන ඇති බවය.

ළමාවියේ දී ප්‍රාථමික පාසල්වල සිදුවන සංස්කෘතියට ළමයාව නිරාවරණය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් විය යුතු බව මොන්ටිසෝරිගේ අදහසයි. මුල් අවධියේ දී පාසලෙන් ලබා දෙන භෞතික දේ ළමයාගේ පෞරුෂය සංවර්ධනයට උදවු කරන අතර මෙම යුගයේ දී ලබාදෙන ද්‍රව්‍යාත්මක දේ සංස්කෘතිය අත්පත් කර ගැනීමට උදවු කරයි. අකර්මක ඉගෙනුමට වඩා ද්‍රව්‍යාත්මක දේ ලබා දී සිදුකරන සකර්මක ඉගෙනුමේ දී ළමයා යම් සිදුවීමක හේතුඵලවාදය හා බලපෑම් හොඳින් හඳුනාගනියි. ළමයා කරනු ලබන කාර්ය කෙරෙහි මානසික අවධානය හොඳින් තහවුරු වීමට නම් එකී කාර්යයෙහි නිමග්න වීමට ගනු ලබන මානසික උත්සහය ඉතා වැදගත් ය. ඉගෙනීමට අවශ්‍යය ද්‍රව්‍යාත්මක දේ ලබා දෙන්නේ නම් මෙම යුගයේ දී ළමා මනස වියුක්ත වීජගණිතය වැනි විෂයන් හා බැඳේ. ද්‍රව්‍යාත්මක දේ නොමැතිව ළමයාව අකර්මක ඉගෙනීමට යොමු කළහොත් ළමයාට පාසල මගහැරී යනු ඇත. සච්ඡන්දඥාණික බව මෙම යුගයේ දී ඉහළින්ම පවතියි. හොඳ කුමක් ද? යමක් සාධාරණ ද? අසාධාරණ ද? යන්න පිළිබඳ සියුම් අවධානයෙන් සිටියි.

**වැඩිහිටි විය (12 - 18)**

නව අනන්‍යතාවක් පැවතීම වැඩිහිටි යුගයේ සුවිශේෂී ලක්ෂණයක් වන හෙයින් ඉංග්‍රිසි භාෂාවෙන් මෙම යුගය "New Identity" ලෙස හඳුන්වයි. මෙම දරුවා පරිපූර්ණත්වයට පත්වූවෙක් නොවෙයි. සංක්‍රාන්තික සමයක වෙසෙන්නෙක් වෙයි. එවැනිම තවමත් තම නිවසට ආදරය කරන දාර්ශනික ගවේෂණවල යෙදෙන, නව

නිෂ්පාදනවලට හා නව නිර්මාණවලට කැමති අයෙකි. තවද, තවමත් වැඩිහිටි මිනිසෙක් නොවෙයි. එහෙයින් වැඩිහිටි වියේ පසුවන්නෙක් (Montessori, 1971) මෙම යුගයේ දී ළමයා භෞතික ලෝකය හා මානව සමාජය ක්‍රියාත්මක වන ආකාරය දකියි. සමස්තයක් ලෙස ලෝකයේ වෙසෙන මිනිසුන්ගේ චර්යාව පිළිබඳව දකියි. ළමයාට සම්බන්ධතා ඇති අයගේ සිට කිසිදා දැක නොමැති පුද්ගලයන් දක්වා වූ සියලු දෙනා පිළිබඳවම හැඟීම් ගොඩනගා ගනියි. මෙය වියුක්ත චින්තන හැකියාවෙහි ඇති ලක්ෂණයකි. මොන්ටිසෝරි මෙය "වියුක්ත ආදරයක්" ලෙස දකියි. තවද, මෙය කිසිදා නුදුටු අය දක්වා දිවෙන පිළිගැනීමක් නැති ආදරයෙකි. ගණනින් අනන්ත නිසා ආදරය දක්වන පිරිස නොගිනිය හැකිය.

වැඩිහිටි විය වෘත්තීමය නැඹුරුතාවක් හා සටන් කාමිත්වයක් ඇතිවන යුගයකි. සමාජයෙහි සාමාජිකයෙක් බවට පත්වෙයි. මෙකී යුගයෙහි පසුවන දරුවා සමාජයට ඔහුගෙන් සෘජු දායකත්වය දිය යුතු බව සිතයි. එවැනිවම ඔහුට පිළිගැනීම අවශ්‍යය වෙයි. මෙය නව අනන්‍යතාවක් සහිත වැඩිහිටි වියෙහි සුවිශේෂී ලක්ෂණයකි.

මොහු ඉතිහාසයට ඇලුම් කරයි. සමාජමය වශයෙන් ගත්විට පෙර අවධිවලදී මෙන් සමාග්‍රහණය සිදු නොවීම මෙම යුගයේ ලක්ෂණයකි. ඔවුනට තමා විසින් ම යමක් විමර්ෂණය කර බැලීමේ අවශ්‍යතාව මෙන්ම තමා විසින්ම යමක් අත්විඳීමේ අවශ්‍යතාව ඇති වෙයි. ඔවුන් තමන් විසින්ම දිශාභිමුඛ වෙයි. එවැනිවම අගය ගොඩ නගා ගනියි. ළමයා පාසල් වැඩ සටහන්වල හිරකාරයකු නොකළ යුතුයි. ඇතැම් අවස්ථාවල සමාග්‍රහණය සඳහා පාසල මගින් හඳුන්වාදෙන වැඩ සටහන්වල පවතින ගැටලු නිසා ඒවා ළමයාගේ සංවර්ධනය සම්බන්ධයෙන් ඵලදායි නොවිය හැකිය. ළමයා කොහොමද? ඇයි? වැනි සංකල්ප ඉගෙන ගන්නා විශාල පාසල් පරිසරයකට පමණක් හා මූලිකමය වශයෙන් යැපෙන පවුලටම පමණක් සීමා නොකළ යුතුය. ඔහුට ජීවත්වීමට සමාජය අවශ්‍යය. ඔහු තවදුරටත් ඉදිරියට යා යුතුය.

මග පෙන්වන ලද පසුබිමක ළමයා පොළොව හා ගැටිය යුතුය. තමාට සුදුසු රැකියාවක් සොයා ගැනීමට අවස්ථාව තිබිය යුතුය. වැඩ කිරීම පමණක් නොව වැඩ කිරීමෙන් මුදල් ඉපයිය යුතුය. ළමයා වැඩ

කිරීම මගින් ආත්ම අභිමානය ළඟාකර ගත යුතුය. ආත්ම විශ්වාසය ගොඩ නගාගත යුතුය (මොන්ටිසෝරි, 1986). වැඩ සහ මුදල යනු කුමක් ද යන්න හොඳින් අවබෝධ කරගත යුතුය. ශාස්ත්‍රීයව ඉගෙනගන්නා දේ සැබෑ පරිසරයක ඉගෙනීමට ඉඩදිය යුතුය. ශිෂ්ටාචාරය කෘෂිකර්මය තුළින් ඉගෙනීමට ඉඩදීම වැදගත්ය (මොන්ටිසෝරි, 1986). කිසියම් අයෙකු උත්සාහයෙන් මුදල් සොයාගෙන ඇත්නම් එහි අදහස ඔහු ප්‍රයෝජනවත් යමක් උපයාගෙන ඇති බවයි. පවුලෙන් දෙන මුදලින් යමෙක් යැපෙන්නේ නම් ඔහු පරපෝෂිතයෙකු වැනිය. පරපෝෂිතයෙකු විය හැක්කේ ආත්ම ගරුත්වයක් ඇති කුමන මිනිසකුට ද? මෙම යුගයේ දරුවා තම පෞරුෂයේ වටිනාකම දන්නා හෙයින් මහන්සි වී යමක් උපයා ගැනීම අගය කොට සලකයි.

වැඩිහිටි වියේ දී ජීවන අත්දැකීම් මගින් දරුවා සංස්කෘතික දියුණුව තවදුරටත් තහවුරු කර ගනියි. ඔහු, ඔහු විසින්ම නිර්මාණය වෙයි. පළමු අවධියේ දී දරුවන් "ගෘහ භාණ්ඩ දරුවන්" ලෙස හැඳින්වූ අතර මෙම යුගයේ දී දරුවන් "ලෝක දරුවන්" ලෙස හඳුන්වයි. වගකීම් සහිත ළමුන් තමාගේ දැක්මට පැමිණෙනු විගස ජාත්‍යන්තර දේශපාලනය, නිෂ්පාදනය හා වාණිජත්වය වැනි ක්ෂේත්‍රවලට දායකත්වයක් සපයයි.

**පරිණතවිය** (18-24)

"මෙම යුගයේ දරුවා තමා කුමක් කරන්නේද?" යන්න මූලධර්මය කොට ගෙන වර්ධනය වෙයි. මොහු විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි යෙදෙයි. හොඳ වරණයක් සහිතව තමා විසින්ම තෝරාගත් ක්‍රියාකාරකම්වල යෙදීම මෙම යුගයෙහි ලක්ෂණයකි. තවද, මෙම යුගයේ දී දරුවා සජීවි ගිණි පුපුරක් විය යුතුය. ආධ්‍යාත්මික, චිත්තවේගීය හා සදාචාර නිදහස අවැසි යුගයකි. මිනිස් ජීවිතයේ විභවතාවන් එම විභවතා මගින් මතුකරගත හැකි ආකාරය හා වගකීම් පිළිබඳ හඳුනාගත් අයෙකි. පරිණතවියේ පසුවන මොහුගේ බලාපොරොත්තු හුදෙක් පුද්ගලික වාසිවලට සීමා නොවේ. තමා පිළිබඳ හැඟීම දෙවන තැනට පත්වෙයි. මුලු සමාජය ගැනම සිතා කටයුතු කරයි. මොහු විවිධ අවධි පසුකොට පැමිණි අයෙකි. එවැනිවම සංවර්ධන ගැටලුවලට මෙන්ම අධ්‍යාපනික ගැටලුවලට ද මුහුණ දී

පැමිණි අයෙකි. මෙම යුගයට අයත් දරුවා ප්‍රශ්නවල අවසාන අධියරේ වෙසෙයි. සංස්කෘතියට නොව අධ්‍යාපනයට දේශ සීමා හෝ සීමා නොමැති බවත් සමස්ත මානව වර්ගයාට අයත් සංස්කෘතිය තුළ තමාට ඉදිරියට යා හැක්කේ කෙසේ ද යන්නත් තීරණය කළ හැකි අවධියක වෙසෙයි. ඔහු තෝරාගත් දේ කුමක් වුවද සංස්කෘතිය කවදාවත් අවසන් නොවන බව දැන සිටියි. සංස්කෘතිය හා අධ්‍යාපනය ජීවිත කාලය පුරාම ලබන්නක් බව දැන අවබෝධයෙන් කටයුතු කරයි (Montessori, 1971).

**සාරාංශය**

වෛද්‍යවරියක් ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ මාරියා මොන්ටිසෝරි ක්ෂේත්‍ර රැසකට තම දායකත්වය ලබා දුන්නාය. වෛද්‍යවරියක් සහ මනෝවිද්‍යාඥවරියක් ලෙස ඇය ළමා සංවර්ධනය පිළිබඳ අවධි හතරක් යටතේ සාකච්ඡා කළ අතර එම එක් එක් අවධියේ දී ළමයා සතුවන කායික, මානසික, චිත්තවේගීය ස්වභාවය පිළිබඳ කරුණු අවධාරණය කොට ඇත. පළමු අවධියේ පළමු කාලච්ඡේදය දී අනුත්සාහිකව අත්දැකීම් ලබා ගන්නා කාලයකි. ළමයා අවශෝෂණ මනසක් සහිත අයෙකි. දෙවන අවධියේ දී සවිඥානිකව පිරිපහදු කරගනිමින් අත්දැකීම් ගොඩ නගා ගනියි. තුන්වන අවධිය සංයුක්ත අවධියෙන් වියුක්ත චින්තන අවධියට ක්‍රමයෙන් මාරුවන සංක්‍රාන්තික සමයකි. වියුක්ත චින්තනය හැකියා සංවර්ධනය වන තුන්වන අවධිය හෙවත් වැඩිහිටි විය වෘත්තියාභිමුඛ යුගයකි. එවැනිවම නව අනන්‍යතාවක් ගොඩනගා ගන්නා යුගයකි. පරිණත වියේ දී තමාගෙන් සමාජයට සිදුවිය යුතු කාර්යය භාරය පිළිබඳ සිතයි. වරණීය ජීවන අත්දැකීම් වර්ධනය කර ගැනීමට යොමුවීම පරිණත වියේහි ප්‍රධානතම ලක්ෂණයකි. තමා පිළිබඳ සිතනවාට වඩා මුළු සමාජයම ගැන සිතා කටයුතු කරයි. සංස්කෘතිය සහ අධ්‍යාපනය ජීවිත කාලය පුරාවටම ප්‍රගුණ කළ යුතු බව සිතයි. මේ අනුව, මාරියා මොන්ටිසෝරි ළමා සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා වැදගත් කරුණු රැසක් මතුකර ඇතිබව පෙනේ. පවුලට හා පාසලට ඒ ඒ අවධියට ගැළපෙන ලෙස ළමයාගේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍යය පෙර පාසල හා පාසල් පරිසර නිර්මාණය කිරීමෙහි සුවිශාල වගකීමක් අධ්‍යාපඥයින් සතුව පවතියි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Emily, C. (2023). *Montessori Planes of Development: A Guide to Understanding Child Development*. Retrieved from: https://www.rhymeandreasonacademy.com/the-planes-of-development.

Marshall, C. (2017). *Montessori Education: AR Review of the Evidence Base. Science of Learning*, 2(1), 1-9.

Meinke, H. (2019). *Exploring the Pros and Cons of Montessori Education*. Retrieved from https://www.rasmussen.edu/degrees/education/blog/pros_cons_montessori_education.

Montessori, M. (1938). *Four Planes as Education*. Amsterdam: AMI.

Montessori, M. (1986). *The Discovery of the Child* (5th ed.).

Montessori, M. (1994). *From Childhood to Adolescence*. AM Josten. Oxford, England: Clio.

North American Montessori Center. (n.d.). Retrieved from: https://www.montessoritraining.net.

Montessori, (1971). *The four Plane of Education*. The Booklet – Text of a Lecture Given by Dr. Maria Montessori. Association Montessori International.

Selda; A, Reyhan M. S; & Nimet, C. K. (2012). *A Different Perspective on Education: Montessori and Montessori School Architecture*. Procedia - Social and Behavioral Sciences, 46, 1866 – 1871.